# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 36 දරන මෝටර් ගමනාගමන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 සැප්තැම්බර් මස 07 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 සැප්තැම්බර් මස 21 වන දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබා ගත හැකිය.

## ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 36 දරන මෝටර් ගමනාගමන (සංශෝධන) පනත

[යශතිකය සටහන් කළේ 1973 සැප්තැම්බර් මස 07 වන දින]

එල්.ඩී.—ඕ. 22/71.

**1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඩු නාමය.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 36 දරන මෝටර් ගමනාගමන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනතේ දීර්ඝ නාමය ප්‍රතියෝජනය කිරීම.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනතෙහි දීර්ඝ නාමය වෙනුවට පහත සඳහන් අලුත් දීර්ඝ නාමය ආදේශ කිරීමෙන් ඒ ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"නිති පතා හා අවස්ථා අනුව පැවැත්වෙන බස් රිය සේවා හා කුලී කාර් සේවා හා තොටුපළ සේවා සැපයීමෙහි සහ ගොඩබිමෙන් හා ජලයෙන් බඩු ගෙන යාමෙහි නියුක්ත ගමනාගමන මණ්ඩලයක් පිහිටුවීම සඳහා සහ ඒ මණ්ඩලයෙහි කාර්යයන් සඳහා අවශ්‍ය වන නිශ්චල හා චංචල දේපල එම මණ්ඩලය විසින් අනිවාර්යයෙන් අත්කර ගැනීම හෝ බලකර ලබාගැනීම පිණිස විධිවිධාන සැලැස්වීම ද මෝටර් වාහන පනත යටතේ නිති පතා හා අවස්ථා අනුව පැවැත්වෙන බස් රිය සේවා හා කුලී කාර් සේවා සඳහා දී ඇති කොට්ඨාස වාහන බලපත්‍ර වලංගු ව පැවැත්ම අවසන් කිරීම ද අනිවාර්යයෙන් අත්කර ගන්නා හෝ බලකර ලබා ගන්නා දේපල වෙනුවෙන් ගෙවිය යුතු වන්දි නිශ්චය කිරීම සඳහා වන්දි විනිශ්චය අධිකාරයක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම ද ඒ මණ්ඩලයේ හා විනිශ්චය අධිකාරයේ බලතල හා යුතුකම් නිශ්චය කර දැක්වීම ද මෝටර් වාහන පනත සංශෝධනය කිරීම හා ඉහත කී කරුණුවලට සම්බන්ධ කාර්යයන් සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය, එහි (1) වන උප වගන්තියෙහි, පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

1—ජේ 21834—9,832 (73/5)

(1) එහි (ආ) ඡේදයට (ඇ) ඡේදය වශයෙන් නැවත අක්‍ෂර යෙදීමෙන් ; හා

(2) (අ) ඡේදයට ඉක්බිති ව ම පහත සඳහන් අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ආ) ජලයෙන් මඟින් ප්‍රවාහණය කිරීම සඳහා තොටුපළ සේවා සැපයීම සහ සෑම වර්ගයකට ම අයත් බඩු ගොඩබිමෙන් ගෙන යාම භාර ගැනීමත්,".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය, එහි (1) වන උප වගන්තියෙහි, පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) (viii), (ix), (x), (xi), (xii), (xiii), (xiv) යන ඡේද පිළිවෙලින් (xi), (xii), (xiii), (xiv), (xv), (xvi) හා (xvii) වශයෙන් නැවත අංක කිරීමෙන් ; සහ

(ආ) (vii) වන ඡේදයට ඉක්බිති ව ම පහත සඳහන් අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(viii) ජලයෙන් මඟින් හා බඩු ප්‍රවාහණය කිරීම සඳහා තොටුපළ සේවා පිහිටුවීම, පවත්වාගෙන යාම හා ක්‍රියාත්මක කිරීම ;

(ix) සෑම වර්ගයකට අයත් බඩු ගෙනයාම භාර ගැනීම, සහ ඒ කාර්යය සඳහා, යම් මෝටර් ප්‍රවාහණ සේවයක අයිතිකරු විසින් බඩු ප්‍රවාහණය කිරීම සඳහා පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන මුදල් හැර චංචල හෝ නිශ්චල හෝ යම් දේපලක් අත්කර ගැනීම හෝ බලකර ලබා ගැනීම ;

(x) සෑම වර්ගයකට ම අයත් මෝටර් වාහන නිෂ්පාදනය කිරීම, කොටස් එකරාශි කොට තැනීම, බෙදා හැරීම හා විකිණීම, සහ සෑම වර්ගයකට ම අයත් මෝටර් වාහන සඳහා වූ අමතර කොටස් නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම හා විකිණීම ;".

6අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියට ඉක්බිති ව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එහි 6අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"තොටුපළවල් පැවරීම.

6අ. (1) රේන්ද විෂයය භාර අමාත්‍යවරයා විසින්, (2) වන උපවගන්තියෙහි විධිවිධානවලට යටත් ව, පහත සඳහන් කාර්යයන්, එනම්,—

(අ) රේන්ද්‍ර ආඥපනත යටතේ පිහිටුවන ලද යම් තොටුපළක් ඒ තොටුපළේ කාර්ය යන්ට සම්බන්ධ වූ හෝ ඒ සඳහා අවශ්‍ය වූ යම් චංචල දේපලක් සහිත ව ලංකා ගමනාගමන මණ්ඩලයට පැවරීමේ කාර්යය සඳහා ; හා

(ආ) ඒ තොටුපළට සම්බන්ධ ජනරජයේ යම් ගිවිසුම් හෝ වගකීම් ලංකා ගමනාගමන මණ්ඩලයට පැවරීමේ කාර්යය සඳහා

කලින් කල නියමයන් කළ හැකි ය.

(2) ඒ සෑම නියමයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එය පළ කරනු ලැබූ දින යෙහි හෝ ඒ නියමයෙහි නිශ්චිත ව සඳහන් කරනු ලබන පසු දිනයක සිට වලංගු වන්නේ ය.

(3) ජනරජය සතු කිසිම චංචල දේපලක් හා කිසිම ගිවිසුමක් හෝ වගකීමක් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැති ව (1) වන උපවගන්තිය යටතේ ලංකා ගමනාගමන මණ්ඩල යට නො පැවරිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වූ නියම යන් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු—

(අ) නියමයෙහි නිශ්චිත ව සඳහන් තොටුපළ හා නිශ්චල දේපල ලංකා ගමනාගමන මණ්ඩලය වෙත සතු විය යුතු ය;

(ආ) නියමයෙහි නිශ්චිත ව සඳහන් ගිවිසුම් ලංකා ගමනාගමන මණ්ඩලයේ ගිවිසුම් වශයෙන් සලකනු ලැබිය යුතු අතර ඒ ගිවිසුම් යටතේ පවත්නා ජනරජය සතු සියලු අයිතිවාසිකම් හා බැඳීම් ලංකා ගමනාගමන මණ්ඩලයේ අයිතිවාසිකම් හා බැඳීම් වශයෙන් සලකනු ලැබිය යුතු ය;

(ඇ) නියමයෙහි නිශ්චිත ව සඳහන් යම් වගකීම් ලංකා ගමනාගමන මණ්ඩලයේ වගකීම් වශයෙන් සලකනු ලැබිය යුතු ය.".

27අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 27 වන වගන්තියට ඉක්බිති ව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 27අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

" බඩු ගෙන යාම සඳහා වූ මෝටර් ප්‍රවාහණ සේවය සඳහා පාවිච්චි කරනු ලබන දේපල අත්කර ගැනීම හෝ බලකර ලබා ගැනීම.

27අ. යම් මෝටර් ප්‍රවාහණ සේවයක අයිතිකරු විසින් බඩු ගෙනයාම සඳහා පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කිරීමට අදහස් කර ඇති මුදල් නොවන අන් කිසි චංචල හෝ නිශ්චල දේපලක් ලංකා ගමනාගමන මණ්ඩලයට අවශ්‍ය වන අවස්ථාවක මේ පනතේ 19, 20, 21, 22, 23, 24, 25, හා 27 වන වගන්තිවල විධිවිධාන ද, මේ පනතේ III වන හා IV වන කොටස්වල විධිවිධාන ද නීතිපතා පැවැත්වෙන බස්රිය සේවයක් සැපයීමේ කාර්යය සඳහා කොච්චිස වාහන බලපත්‍රයක් දරන්නා විසින් පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කිරීමට අදහස් කර ඇති දේපල අත්කර ගැනීමේ දී හෝ බල කර ලබා ගැනීමේ දී අදාළ වන ආකාරයෙන් ම සහ ඒ ප්‍රමාණයට ම ඒ දේපල අත්කර ගැනීමට හෝ බලකර ලබා ගැනීමට හෝ ඒ සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස්කිරීම් සහිත ව අදාළ වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තියේ (1) වන උප වගන්තිය වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රියක හෝ කුලී මෝටර් රියක ගමන් කරන මගියකු—

(අ) තමාගෙන් අයවිය යුතු ගාස්තුව ගෙවීම මග හරිතහොත්; හෝ

(ආ) ස්වකීය ගමනාන්තයට පැමිණි විට බස්රියෙන් පිටවීම ඔනෑකමින් ම ප්‍රතික්ෂේප කරතහොත් හෝ නොකර සිටිතහොත්; හෝ

(ඇ) අසභ්‍ය, අශෝභන හෝ අප්‍රිය වචන පාවිච්චි කරත හොත් හෝ අසභ්‍ය, අශෝභන හෝ අප්‍රිය සංඥවක් කරතහොත් හෝ යම් තැනැත්තකු කෝප කරවන පරිදි හෝ ඔහුට අපහාස වන පරිදි හැසිරෙතහොත්; හෝ

(ඈ) ඒ බස්රියෙහි හෝ කුලී මෝටර් රියෙහි කෙල ගැසුවහොත් හෝ ඒ බස්රියෙහි හෝ කුලී මෝටර් රියෙහි යම් කොටසක් ඔනෑකමින් ම අපවිත්‍ර කරත හොත්; හෝ

(ඉ) ඒ බස්රියෙහි හෝ කුලී මෝටර් රියෙහි දුම් බීම තහනම් කිරීමේ දැන්වීමක් ප්‍රදර්ශනය කොට ඇති කොටසක දුම් පානය කරතහොත් හෝ දැල්වෙන සිගරැට්ටුවක්, සුරුට්ටුවක් හෝ පයිප්පයක් රැගෙන යතහොත් ; හෝ

(ඊ) යම් කිසිවකු කෝප කරවන අන්දමේ හෝ යම් තැනැත්තකුට හෝ දේපලකට අනතුරු හෝ හානි සිදුවිය හැකි අන්දමේ බෝතලයක්, ද්‍රව්‍යයක් හෝ වෙනත් දෙයක් ඒ බස්රියෙන් හෝ කුලී මෝටර් රියෙන් පිටතට වීසි කරතහොත්

ඔහු වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙසියයකට නොවැඩි දඩයකට යටත් වන්නේ ය:

එසේ වුව ද යම් තැනැත්තකු තමාගෙන් අය විය යුතු ගාස්තුව මෙන් දෙගුණයක මුදලක් සමග රුපියල් විස්සක දඩ මුදලක් එවැනි ගෙවීම් භාර ගැනීමට ලංකා ගමනාගමන මණ්ඩලය විසින් බලය පවරන ලද එම මණ්ඩලයේ නිලධරයකුට ගෙවතහොත් ඒ තැනැත්තාට විරුද්ධ ව ඉහත සඳහන් (අ) ඡේදය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් නඩු පැවරීමක් හෝ නඩුවක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තියට ඉක්බිති ව ම පහත සඳහන් අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒවා ඒ ප්‍රඥප්තියේ 84අ වන වගන්තිය හා 84ආ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය :— *(84අ වන සහ 84ආ වන අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.)*

*(ප්‍රවේශ පත්‍ර නොමැති ව ගමන් කිරීම වරදක් බව.)* 84අ. ලංකා ගමනාගමන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ වරපත්‍රයක් නොමැති ව හෝ ප්‍රවේශ පත්‍රයක් මිලට නොගෙන එම මණ්ඩලයේ බස් රියක හෝ කුලී මෝටර් රියක මගියකු වශයෙන් ගමන් කරන තැනැත්තෙක් වරදක් කරන්නේ ය:

එසේ වුව ද යම් තැනැත්තකු තමාගෙන් අය විය යුතු ගාස්තුව මෙන් දෙගුණයක මුදලක් සමග රුපියල් විස්සක දඩ මුදලක් එවැනි ගෙවීම් භාර ගැනීමට ලංකා ගමනාගමන මණ්ඩලය විසින් බලය පවරන ලද එම මණ්ඩලයේ නිලධරයකුට ගෙවතහොත් ඒ තැනැත්තාට විරුද්ධ ව මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන යටතේ වූ වරදක් සම්බන්ධයෙන් නඩු පැවරීමක් හෝ නඩුවක් පවත්වාගෙන යාම නොකළ යුතු ය:

එසේම තව දුරටත් තම ගාස්තුව ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධ ව 84 වන වගන්තිය යටතේ හෝ මේ වගන්තිය යටතේ නඩු පවරනු ලැබූ අවස්ථාවක, තමා ප්‍රවේශ පත්‍රයක් මිලයට ගත් බව හෝ තමා ළඟ වලංගු වරපත්‍රයක් තිබුණු බව ඔප්පු කිරීමේ භාරය ඒ තැනැත්තා කෙරෙහි විය යුතු ය.

වරදකරුවන් අත් අඩංගුවට ගැනීම. 20 අධි.

84ඈ. අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි පටහැනි ව කුමක් සඳහන් ව ඇතද මේ පනතේ 84 වන වගන්තිය යටතේ හෝ 84අ වන වගන්තිය යටතේ දඬුවම් කළ හැකි වරදක් කරන තැනැත්තකු ලංකා ගමනාගමන මණ්ඩලයේ පරීක්ෂකයකුගේ තත්ත්වයට නො අඩු තත්ත්වයේ නිලධරයකු විසින් හෝ එකී නිලධරයකු විසින් තමාගේ සහායට කැඳවනු ලබන යම් තැනැත්තකු විසින් හෝ යම් පොලිස් නිලධරයකු විසින් වරෙන්තුවක් හෝ ලිඛිත බලයක් නොමැති ව නිත්‍යානුකූල ව අත් අඩංගුවට ගනු ලැබිය හැකි ය ; තව ද එසේ අත් අඩංගුවට ගනු ලබන සෑම තැනැත්තකු ම—

(අ) නිත්‍යානුකූල ව කටයුතු කිරීම සඳහා වහා ම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියට පැමිණ විය යුතු ය ; නැතහොත්

(ආ) එසේ කළ නොහැකි අවස්ථාවක, නීත්‍යානුකූල ව කටයුතු කිරීම සඳහා ළඟම ඇති පොලිස් ස්ථානයෙහි කාර්ය භාර නිලධරයාට වහා ම භාර දිය යුතුය :

එසේ වුව ද ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝවක් හෝ බස් රිය ස්ථානයක් භාර නිලධරයකුගේ තත්ත්වයට නො අඩු තත්ත්වයේ නිලධරයකු විසින් විධාන කරනු ලබන පරිදි, මහෙස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියෙහි පෙනී සිටින ලෙස තමාට නියම කරනු ලැබුවහොත් හා නියම කරනු ලැබූ විට එසේ පැමිණ සිටින බවට ඇපකරුවන් ඇති ව හෝ නොමැති ව ඒ තැනැත්තා විසින් ඇපකරයක් අත්සන් කරනු ලැබූ විට ඒ නිලධරයා විසින් ඒ තැනැත්තා නිදහස් කළ හැකි ය. ".

මේ පනතේ විධිවිධාන අතීතයටත් බලපාන ලෙස ක්‍රියාත්මක වීම.

9. මේ පනතේ විධිවිධාන ප්‍රධාන ප්‍රඥප්තිය ආරම්භ වූ දිනයේ දී ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබේ.